# භාෂාමය දර්ශනයෙහි ප්‍රභවය සහ විකාශය

පූජ්‍ය හෝමාගම ධම්මානන්ද හිමි

## ප්‍රවේශය

සමස්ත බටහිර දර්ශන ඉතිහාසය, එහි පවත්නා මතුපිට ලක්ෂණ පදනම් කොටගෙන පුළුල් ව අධ්‍යයනය කිරීමේ දී අධ්‍යයන පහසුව සඳහා සහ ඓතිහාසික පසුබිම පදනම් කොටගෙන ප්‍රධාන සහ ප්‍රමුඛ අවධි හතරකට බෙදා දක්වමු. එ නම්,

1. ඈත ග්‍රීක දර්ශන අවධිය
2. මධ්‍යතන ක්‍රිස්තියානි දර්ශන අවධිය
3. නූතන දර්ශන අවධිය
4. මෑත සමකාලීන දර්ශන අවධිය, වශයෙනි.

අධ්‍යයනය කිරීමේ සහ විශ්ලේෂණය කිරීමේ පහසු ව සඳහා බටහිර දර්ශන ඉතිහාසය මෙ වැනි විභජනයකට හෙවත් වර්ගීකරණයකට භාජනය කළ ද ඒ ඒ අවධිය තුළ දී දාර්ශනිකයන්ගේ සාකච්ඡාවට භාජනය වූ කේන්ද්‍රීය සංකල්ප හෙවත් දාර්ශනික මත යුගයෙන් යුගයට මුළුමනින් ම එකිනෙකට වෙනස් වූ හෝ පරස්පරතාවලින් සැදුම්ලත් දේ යැයි සටහන් කිරීම බෙහෙවින් උගහට ය. එ නම් දර්ශන ඉතිහාසයේ දාර්ශනික සාකච්ඡා අතර මොන ම ආකාරයකවත් සබඳතාවක් නැතැයි කීම අපහසු ය. එයට හේතුව මුල් දාර්ශනික අවධිය හැමවිට ම තවත් පශ්චාත්කාලීන දාර්ශනික අවධියකට මග පාදා ඇති බැවිනි. මෑත කාලීන බටහිර දර්ශනය නියෝජනය කරන කාල් මාක්ස් මේ සඳහා ආදර්ශ කොට ගත හැකි ය. කාල් මාක්ස් වරක් සඳහන් කර සිටියේ තමා විඥානවාදී දාර්ශනික හේගල්ව දෙපයින් සිට වූ බව යි. එ නම් ඔලුවෙන් සිටි හේගල් දෙපයින් සිට වූ බව යි. කාල් මාක්ස් මෙ වැන්නක් සඳහන් කරන්නේ විඥානවාදී දාර්ශනිකයන් (ප්‍රධාන වශයෙන් හේගල්) මෙතෙක් උත්සාහ ගත්තේ ලෝකය විස්තර කිරීමට ය. එහෙත් කළ යුත්තේ ලෝකය වෙනස් කිරීම ය. යන ඔහුගේ ඓතිහාසික භෞතිකවාදී දාර්ශනික විමර්ශනය පාදක කරගෙන ය.

මේ නිසා එක් අවධියක දී කිසියම් දාර්ශනිකයකුගේ කේන්ද්‍රීය සංකල්පය (main concept) කිසියම් ආකාරයකට ඊට පෙර හෝ පශ්චාත්කාලීන අවධියක දී වෙනත් දාර්ශනිකයකුගේ හෝ දාර්ශනික ගුරුකුලයක් විසින් සමස්ත අන්තර්ගතය

(the content) එකම වී එහෙත් වෙනත් ආකෘතියක් හෙවත් ස්වරූපයක් (form) මගින් ඉදිරිපත් වී ඇති බව ඉතා පැහැදිලි ය. ඈත ග්‍රීක දාර්ශනික අවධිය නියෝජනය කරන ප්ලේටෝ ද්වෛතවාදයක් (dualism) ඉදිරිපත් කරනු ලැබුවේ බාහිර භෞතික ලෝකය පදනම් කරගෙන ය. ප්‍රපඤ්ච ලෝකය හෙවත් වෙනස් වන ලෝකය හා ආකෘති ලෝකය හෙවත් නො වෙනස් වන ලෝකය ලෙස එය හැඳින්විණ. මෙම ප්ලේටෝනික ද්වෛතවාදී දර්ශනය ම වෙනත් ආකෘතියකින් නූතන අවධියේ දී නැවත සාකච්ඡා වී තිබේ. එ නම් කාටීසියානු ද්වෛතවාදය යි. නූතන දර්ශන අවධියේ පියා ලෙස සැලකෙන ඩේකාට්ස් විසින් ඉදිරිපත් කළ මෙම ද්වෛතවාදය පදනම් වූයේ ප්ලේටෝගේ මෙන් භෞතික ලෝකය මත නො ව පුද්ගලයා හා සම්බන්ධ ව ය. කාය-චිත්ත ගැටලුව (body- mind problem) ලෙස අප හඳුන්වන්නේ මෙය යි.

මීට අමතර ව විඥානවාදී ගුරුකුලයේ අග්‍ර ඵලය ලෙස සැලකෙන හේගල්ට පදනම් සකස් කළ විශ්ලේෂී දර්ශන විධි ක්‍රමයේ පුරෝගාමියෙකු වූ ඉමැනුවෙල් කාන්ට් ස්වකීය දාර්ශනික පද්ධතියෙන් ද ද්වෛතවාදී විග්‍රහයක් ඉදිරිපත් කර තිබේ. ප්‍රපඤ්ච සහ නිශ්ප්‍රපඤ්ච සංකල්පය ලෙස ඔහු සටහන් කර තිබෙන්නේ මේ ගැන ය. ප්ලේටෝට සහ ඩේකාට්ස්ට වඩා නවීනතම ආකාරයකට, නවමු ආකෘතියක් ඔස්සේ එක ම සංකල්පය සාකච්ඡා කර තිබෙන ආකාරය මෙයින් පෙනී යයි.

මෙම කරුණුවලින් අවධාරණය කෙරෙන්නේ බටහිර දර්ශන ඉතිහාසය අවධි ලක්ෂණ පදනම් කරගෙන හෝ වෙනයම් සාක්ෂි මත යුග බෙදා දැක්වුව ද බොහෝ දාර්ශනික සංකල්ප සිහින් හුයක් මෙන් සෑම අවධියක් ම එකිනෙක හා සම්බන්ධ කරමින් ගලා ගොස් ඇති බව යි. මේ නිසා වියුක්ත වූ අවධි ලක්ෂණ පිළිබඳ අපට කථා කළ නො හැකි ය. වරක් ඉමැනුවෙල් කාන්ට් සඳහන් කර සිටියේ තමාව ආදානග්‍රාහී නිද්‍රාවෙන් අවදි කරන ලද්දේ ඩේවිඩ් හ්‍යුම් විසින් බව ය.

විද්‍යාවක් වශයෙන් ඉදිරිපත් කරනු ලැබිය හැකි ඕනෑම අනාගත පාර භෞතික විද්‍යාවකට ප්‍රස්තාවනාවක් (Prolegomena to Any Future Metaphysics that will be able to Present Itself as a Science) නමැති කෘතියට අයත් පිවිසුමෙහි තමාගේ ආදානග්‍රාහි නිද්‍රාව (dogmatic slumbers- dogmaticschen schlummer) පලවාහරින ලද්දේ ඩේවිඩ් හ්‍යුම් විසිනැ යි කාන්ට් තෙමේ ම සඳහන් කරයි.[1]

විශේෂයෙන් බටහිර දර්ශන ඉතිහාසයේ දාර්ශනිකයන් තම දාර්ශනික කතිකා සම්බන්ධ ව කිසියම් එකඟතාවකට - සම්මුතියකට පත් ව ඇත්නම් ඒ ඉතා කලාතුරකිනි. එකම කරුණ සම්බන්ධ ව වුව ද ඔවුහු විවිධ මත දැරූහ. එහෙත් මෙයින් දාර්ශනිකයන් දාර්ශනික ලෝකයේ එකඟතාවෙන් යුක්ත ව ක්‍රියා කළ යුතු ය යන්නක් අදහස් නො වේ. එසේ එකඟතාවන්ට නො එළඹීම නිසා ම යි, විවිධ දාර්ශනික පද්ධති ගොඩනැඟී ඇත්තේ. එහෙත්, දාර්ශනික විචාරකයකු විසින් කිසියම් දාර්ශනික කතිකා දෙකක් ඉතා සියුම් තාර්කික විශ්ලේෂණයකට භාජනය කර බැලුවහොත් ඉහත සඳහන් කළාක් මෙන් ඔහුට පෙනී යන්නේ, එහි බොහෝ එකඟතා හෙවත් සමානකම් පවත්නා බව යි. මේ නිසා ම තමාට පෙර සිටි දාර්ශනිකයන්ගෙන් පශ්චාත්කාලීන

දාර්ශනිකයන් සෘජු ලෙස ම පන්නරය ලබා ඇති බව ද සඳහන් කළ හැකි ය. ඉහත කරන ලද උපුටා දැක්වීමෙන් ම මෙය සනාථ වේ.

බටහිර දර්ශනය පිළිබඳ ව මෙ වැනි සංක්ෂිප්ත විවරණයක් ඉදිරිපත් කිරීමෙන් මෙහි දී අපේක්ෂා කරන ලද්දේ කිසියම් දාර්ශනිකයකු හෝ දාර්ශනික පද්ධතියක් හදිසියේ හෙවත් ආකස්මික ව පහළ නො වූ බව සහ නො වන බව පෙන්වා දීමට ය. ඕනෑම දාර්ශනික පද්ධතියක් කෙරෙහි එය විකසිත වූ සමාජ, ආර්ථික, දේශපාලනික, හා සංස්කෘතිමය සංසිද්ධි වක්‍ර ව හෝ සෘජු ව බලපා ඇත. මේ බව සනාථ කෙරෙන සාක්ෂි කිහිපයක් ම ඉහත දක්වන ලදි. සමකාලීන භාෂාමය දර්ශනය (contemporary Lingustic Philosophy ) කෙරෙහි ද මේ පසුබිම් සාධකයෝ බලපානු ලැබූහ.

## දාර්ශනිකයාගේ මෙවලම් (tools)

තවද භාෂාමය දාර්ශනික ක්‍රියාවලිය, සමකාලීන දාර්ශනිකයන්ට පමණක් සීමා වූවක් ද නො වේ. මක් නිසා ද? ඈත ග්‍රීක යුගයේ සිට දාර්ශනිකයා තම චින්තනය මෙහෙය වූයේ ස්වාභාවික හෙවත් ව්‍යවහාරික (natural or ordinary language) භාෂාව උපයෝගී කොට ගෙන ය. විද්‍යාවේ විද්‍යාත්මක පර්යේෂණ කාර්‍ය සඳහා විද්‍යාඥයා විවිධ උපකරණ හෙවත් මෙවලම් (tools) භාවිත කරන්නා සේ ය. එම නිසා ඈත ග්‍රීක දර්ශනයේ තේල්ස් ද මධ්‍යතන යුගයේ ඔගස්ටින්, ඇක්වයිනාස් ආදීන් ද නූතනයේ ඩෙකාට්ස්, හ්‍යූම් ආදීන් ද තම චින්තනය ප්‍රකාශයට පත් කරන ලද්දේ භාෂාව භාවිත කරමිනි. සමකාලීන භාෂා දර්ශනය පිළිබඳ පවත්නා සුවිශේෂීතාව වන්නේ, සාම්ප්‍රදායික දාර්ශනිකයන් (traditional philosophers) තම දාර්ශනික කාර්‍ය සඳහා මෙවලමක් හෙවත් උපකරණයක් ලෙස යොදාගත් භාෂාව මොවුන් එනම් සමකාලීන භාෂා දාර්ශනිකයන් තම දාර්ශනික කාර්‍ය ම භාෂා විශ්ලේෂණයක් කර ගැනීම යි.

සමකාලීන බටහිර දර්ශනය තුළ මහත් විපර්යාසයක් සිදු කළ භාෂා විශ්ලේෂණවාදී දර්ශනයෙහි පුරෝගාමියා ලෙස සැලකෙන ලුඩ්විග් විට්ගන්ස්ටෛන්, භාෂා දර්ශනය ගොඩනැගීම සඳහා සුවිශේෂී මග පෙන්වීමක් කළ දාර්ශනිකයන් අතර විට්ගන්ස්ටෛන්ගේ ගුරුවරයා ලෙස ක්‍රියා කළ බට්‍රන්ඩ් රසල් මෙන් ම ඒ.ජේ. එයර් තාර්කික යථානුභූතවාදී ගුරුකුලය මෙහි දී කිසිසේත් ම අමතක කළ නො හැකි ය. මීට අමතර ව විශේෂයෙන් යුරෝපයේ සහ එංගලන්තයේ සමකාලීන අවධිය ආලෝකවත් කළ විශ්ලේෂී දාර්ශනික විධික්‍රම විට්ගන්ස්ටෛන්ට මෙන් ම ඔහුට පසුබිම් සකස් කළ ඉහත දක් වූ දාර්ශනිකයන් කෙරෙහි ද සෘජු බලපෑමක් සිදු කර ඇති බව ද මෙහි දී සඳහන් කළ යුතු ය. විශ්ලේෂී විධි ක්‍රමයේ බලපෑම් කෙතෙක් ද යන වග මුල් කාලීන සහ පශ්චාත් කාලීන විට්ගන්ස්ටෛනියානු දර්ශනයෙන් මනාව පිළිබිඹු වේ.

(Yet both the early Wittigenstein (represented by his Tractatus Logico Philosophicus, 1992) and the later (repersented by the philosophical Investigation 1953) are central examples of Anaytical Philosophy) [2]

අනෙක් අතට මෙම විශ්ලේෂී දාර්ශනික විධික්‍රමය උපයෝගී කර ගත්තේ දාර්ශනික ක්ෂේත්‍රය සඳහා පමණක් නො වේ. මනෝවිද්‍යා ක්ෂේත්‍රයේ මහත් පෙරළියක් සිදු කළ සිග්මන් ප්‍රොයිඩ් මනස විශ්ලේෂණය කරමින් පුද්ගල චර්යාව පිළිබඳ නවත ම විග්‍රහයක් ඉදිරිපත් කළේත් විද්‍යාවේ දර්ශනය තුළ (Philosophy of science) ය.

කාල්පොපර් සහ තෝමස්කුන් වැනි විධික්‍රමවාදීන් (Methodologists) කාල්පොපර් සහ තෝමස්කුන් වැනි විධික්‍රමවාදීන් (Methodologists) විද්‍යාවේ ඉතිහාසය පිළිබඳ නවතම විශ්ලේෂණ ඉදිරිපත් කළේත් නවත ම දේශපාලන දර්ශනයක් ඉදිරිපත් කිරීමට සමාජ පන්ති ක්‍රමයේ ඉතිහාසය පිළිබඳ විශ්ලේෂණයක යෙදෙන්නට කාල් මාක්ස්ට හැකි වූයේත් මෙම විශ්ලේෂී විධික්‍රමය ඔවුන්ගේ විමර්ශනවලට කාන්දුවීම නිසා ය. භාෂා විශ්ලේෂණවාදය බිහි වීම ද මේ හා සම්බන්ධ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස සඳහන් කිරීම යුක්ති යුක්ත ය.

භාෂා දර්ශනය බිහිවීම කෙරෙහි බලපෑ සමාජ සංසිද්ධි සහ පුද්ගල සාධක මොනවා ද යන්න තව දුරටත් සටහන් කිරීමට පෙර සමකාලීන භාෂා විශ්ලේෂණවාදය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද යන්න අර්ථවත් කරගැනීම, පැහැදිලි කර ගැනීම මෙහි දී අප විසින් කළ යුතු ප්‍රමුඛ කාර්‍යයක් වේ. සමකාලීන භාෂාමය දර්ශනය දාර්ශනික ලෝකයේ මහත් පෙරළියක් ඇති කළා මෙන් ම වැඩි කතිකාවතකට ලක් වූ විධික්‍රමයක් ලෙස මීට පෙර ද සඳහන් කරන ලදි. සාම්ප්‍රදායික ව පැවති දාර්ශනික ගමන් මග සහ දාර්ශනිකයාගේ කාර්‍යභාරය නව මාවතකට යොමු කිරීම එම සුවිශේෂීතාව යි.

භාෂාමය දර්ශනය සමකාලීන බටහිර දාර්ශනික ක්ෂේත්‍රයේ විශාල පෙරළියක් ඇති කිරීමට සමත් වූ දාර්ශනික සම්ප්‍රදායක් වශයෙන් හඳුන්වා දීමට පුළුවන.[3] මේ බව සනාථ කෙරෙන්නේ, එ නම් භාෂාමය දර්ශනය කිසියම් ආකාරයක නව්‍ය වූ නැඹුරුවක් දාර්ශනික ක්ෂේත්‍රයේ ඇති කළ බව සනාථ කෙරෙන සාධක ලෙස විසිවන සියවසේ මුල් කාලයේ දාර්ශනිකයන් විසින් රචිත බොහෝ කෘතී නාමාවලි මඟින් පෙන්වා දිය හැකි ය. එ නම් මෙ කල ලියවුණු බොහෝ දාර්ශනික කෘති භාෂාමය දර්ශනය සම්බන්ධ කොටගෙන ඉදිරිපත් කර තිබීම යි.

විසිවන සියවසේ මැදභාගය වනවිට මේ අනුව භාෂා දර්ශනය විශේෂයෙන් බ්‍රිතාන්‍ය දර්ශනය තුළ ප්‍රබල ප්‍රවාහයක් බවට පත් විය. මෙම නව දාර්ශනික එළඹුම අනුගමනය කළ වුන් සම්භාව්‍ය දර්ශනයේ සාර්ව විධික්‍රමය (Macro Approach) ප්‍රතික්ෂේප කළා පමණක් නො ව දර්ශනය භාෂා විග්‍රහයකට බිඳලීමේ කාර්‍යයට ද නො මඳ ව දායක වූ බව පෙනේ. එ කල ලියූ පොත්වල ශීර්ෂයන්ගෙන් භාෂා විග්‍රහයේ වර්ධනය පෙන්වා දෙනු ලබයි. Logical syntax of Language language Truth and Logic, Ethics and Language, Language and Intlligence, Logic and Language, Language of Morals, The Language of Time[4] දර්ශනයේ කාර්‍යභාරය විය යුත්තේ භාෂා විශ්ලේෂණය කිරීම යැයි භාෂා දර්ශනයේ කේන්ද්‍රීය තේමාව යි. එසේ කිරීමේ අවශ්‍යතාව කුමක් ද? යන්න හා දාර්ශනිකයන්ගේ කාර්යභාරය වියයුත්තේ භාෂා

විශ්ලේෂණ ක්‍රියාවලියකට පමණක් සීමා කිරීමේ පදනම කුමක් ද? යන්න මෙහි දී අපට නිතැනින් ම නැඟෙන ගැටලුවකි. ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන භාෂා දාර්ශනිකයා සටහන් කර සිටියේ සමකාලීනය තෙක් සාම්ප්‍රදායික දාර්ශනිකයා උත්සාහ ගත්තේ, දර්ශනය නමින් විද්‍යමාන වන දාර්ශනික ගැටලු විසඳීමට ය. එහෙත් ඔහුට ඒවා මෙතෙක් විසඳී නොමැති අතර විසඳා ගැනීමට ද නො හැකි වී ඇත. මෙ නිසා මෙතෙක් දාර්ශනිකයා කර තිබෙන්නේ ගැටලු විසඳනවා වෙනුවට තව තවත් එම ගැටලු සංකීර්ණ තත්වයට පත් කිරීම යි. මේ නිසා අප කළ යුත්තේ දාර්ශනික ලෝකය ම මහත් කැලඹීමකට පත් කළ ගැටලුවල ස්වභාවය, (Nature of Philosophical Problems) තාර්කික ස්වභාවය මනාව තේරුම් ගැනීම බව භාෂා දාර්ශනිකයා අවධාරණය කරයි. සමකාලීන භාෂා විශ්ලේෂණයේ දී දාර්ශනිකයා පෙන්වා දෙන්නේ, බොහෝ දාර්ශනික ගැටලු දාර්ශනිකයන්ගේ අර්ථශූන්‍ය (Meaningless) භාෂා භාවිත නිසා හටගන්නා බව යි. එම නිසා භාෂාමය දාර්ශනිකයා උත්සාහ ගන්නේ, එම ගැටලු විසඳීම සඳහා භාෂාව විශ්ලේෂණය කොට එහි සීමා හා හැකියා පිළිබඳ පොදු සම්මුතියකට ඒමට ය.

දර්ශන ඉතිහාසය පිළිබඳවත් දාර්ශනිකයන් පිළිබඳවත් අධ්‍යයනයක් සිදු කිරීමේ දී සැලකිය යුතු සංකීර්ණ ගැටලු සමූහයක් අප ඉදිරියෙහි විද්‍යමාන වේ. හේතුඵලභාවය පිළිබඳ ගැටලුව සත්‍ය පිළිබඳ ගැටලුව, සතෝයක්‍ෂණිතා ව පිළිබඳ ගැටලුව, ඥානය පිළිබඳ ගැටලුව, සාමාන්‍යයන් පිළිබඳ ගැටලුව, පැවැත්ම පිළිබඳ ගැටලුව, බාහිර ලෝකය පිළිබඳ ගැටලුව, දෙවියන් පිළිබඳ ගැටලුව, යනාදී කී නොකී දාර්ශනික ගැටලු මෙසේ විද්‍යාමන වේ. විට්ගන්ස්ටෛන් නැමැති භාෂාමය දාර්ශනිකයාට අනුව දර්ශන ඉතිහාසයේ ග්‍රීක, මධ්‍යකාලීන, නූතන සහ සමකාලීන යුගවල දර්ශන ක්ෂේත්‍රය පුරා ප්‍රචලිත දාර්ශනික ගැටලු හෙවත් දාර්ශනික ප්‍රශ්න හටගෙන ඇත්තේ භාෂාව හේතු කොට ගෙන ය. දර්ශනයේ ව්‍යායාමය වනාහි එම ගැටලු හෙවත් ප්‍රශ්න පැහැදිලි කිරීම නම් වේ.[5]

මෙහි දී පාඨකයාට නිතැතින් ම නැගෙන ගැටලුවක් වන්නේ දාර්ශනිකයා විසින් කළ යුතු යැයි භාෂා දාර්ශනිකයන් විසින් යෝජනා කරන මෙම භාෂා විශ්ලේෂී ක්‍රියාවලිය දාර්ශනිකයාට හා දාර්ශනික ක්ෂේත්‍රයට වඩා ඉතා නිරවුල් සහ පැහැදිලි ව වාග් විද්‍යාඥයෙකුට කළ හැකි නො වේ ද? යන්න යි. වාග් විද්‍යාඥයෙකුගේ කාර්ය ද මේ හා සමාන ක්‍රියාවලියක් වන බැවිනි. එම නිසා සත්‍ය වශයෙන් ම මෙම කාර්ය වඩාත් හොඳින් වාග් විද්‍යාඥයෙකු විසින් හෝ ශබ්දකෝෂ කරුවකු විසින් නොකරන්නේ ද? ඇත්තටම භාෂා දාර්ශනිකයා යෝජනා කරන ලද දාර්ශනික ක්‍රියාවලිය හා ඉහත දැක්වූ වාග් විද්‍යාඥයන් ආදීන්ගේ ක්‍රියාවලීන් හෙවත් ක්ෂේත්‍රයන් එකිනෙකට හාත්පසින් ම වෙනස් වේ. භාෂාකරුවන් හෙවත් වාග් විද්‍යාඥයන් මග පෙන්වන්නේ කිසියම් විනයකට අනුව භාෂාව භාවිත කරමින් අදහස් ප්‍රකාශ කිරීම සඳහා විශේෂයෙන් අපගේ ව්‍යාකරණ දැනුම නිවැරදි කිරීම භාෂාවේ ඓතිහාසික විකාශනයන් හඳුනාගෙන ඒ අනුව අපගේ භාෂා දැනුම පෝෂණය කිරීම යි. භාෂා

දාර්ශනිකයාට අනුව භාෂාවේ තාර්කික ස්වභාවය හා ව්‍යාකරණ දැන සිටීම පමණක් ප්‍රමාණවත් නො වේ. භාෂාමය ප්‍රකාශනයේ නිරවද්‍යතාව දැනගත යුත්තා සේ ම එ මගින් ප්‍රකාශ වන හෙවත් ඉදිරිපත් කෙරෙන කරුණුවල (Facts) සත්භාවය (Being) පිළිබඳව ද දාර්ශනිකයා තම සැලකිල්ල යොමු කළ යුතු ය.

සමකාලීන භාෂාමය දාර්ශනිකයාට අනුව දාර්ශනික ගැටලු - ප්‍රශ්න පැන නඟින්නේ ව්‍යාකරණය (Grammer) වැරදී යාම නිසා නො වේ. සමහර විට එ මගින් ද යම් යම් ගැටලු මතු විය හැකි ය. එහෙත් ඒවා බරපතල නො වේ. ඒවා නිවැරදි කර ගැනීම පහසු ය. එහෙත් සද්භාවයම සීමාව ඉක්මවා කරුණුමය දේ ඉදිරිපත් කෙරෙන භාෂාවෙන් කරුණුමය නො වන දේ ගැන කතා කළ විට ඊට වඩා බැරෑරුම් ගැටලු පැනනඟී. මේ අනුව ව්‍යාකරණකරුවා හෙවත් වාග් විද්‍යාඥයා භාෂාවේ ව්‍යාකරණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන අතර භාෂාමය දාර්ශනිකයා ප්‍රකාශනයේ ව්‍යාකරණානුකූල භාවයට අමතර ව ප්‍රකාශනය හා සම්බන්ධ සද්භාවමය අංශය අවධාරණය කරයි. මේ නිසා මොවුන් දෙදෙනාගේ කාර්යන් එකිනෙකට වෙනස් ස්වරූප ගනී.

1. නිමල්ට සුදු කමිසයක් තිබිණ, එය දැන් නැති වී ඇත. එහෙත් මහන්සි වී සොයන්නේ නම් ඔහුට එය සොයා ගත හැකි ය.

2. නිමල්ට අද උදේ තද බල හිසේ අමාරුවක් තිබිණ. දැන් එය නැති වී ඇත. එහෙත් මහන්සි වී සොයන්නේ නම් ඔහුට එය සොයා ගත හැකි ය.

ඉහත එන පළමු දෙවැනි ප්‍රකාශයන් ආකෘතිමය (Stucture) වශයෙන් මෙන් ම ව්‍යාකරණානුකූල ව සමාන සහ නිවැරදි ස්වරූපයක් ගෙන තිබේ. එහෙත් පළමුවැන්න හා සම්බන්ධ වන්නේ කරුණුමය දෙයකි. කරුණුමය දේ නම් ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ හා සම්බන්ධ දේවලින් යුක්තවීම යි. දෙවැන්න එයින් සපුරා වෙනස් වෙයි. එහි ප්‍රත්‍යක්ෂමය වශයෙන් හඳුනාගත හැකි කරුණුමය කිසිවක් නැත. පළමු කියමන සද්භාවමය ප්‍රකාශනයක් වන්නා සේ ම සත්‍යෝක්ෂණීය සංධරයට වැටේ. එහෙත් දෙවැන්න සද්භාවයමය නො වන්නා සේ ම සත්‍යෝක්ෂණීය (Verification) සංධරයෙන් ඉවත සිටින්නකි. දාර්ශනිකයාට ඉතිහාසය පුරාම වැරදී ඇත්තේ මෙහි දී ය. එ නම් කරුණුමය නො වන දේ කරුණුමය දේ ලෙස සලකා ක්‍රියා කිරීම නිසා ය. ඉහත දෙවැනි කියමන හා සම්බන්ධ වන්නේ අන් කිසිවක් නො ව අර්ථශූන්‍ය බව යි. සමකාලීන භාෂාමය දාර්ශනිකයාගේ උත්සාහය මෙම අර්ථශූන්‍යභාවය ජනිත කරන භාෂා භාවිතයෙන් දාර්ශනිකයා මුදවා ගැනීම යි.

මේ නිසා ඉහත ප්‍රකාශන හා සම්බන්ධ ව වාග් විද්‍යාඥයාට හෝ ව්‍යාකරණකරුට හෝ කිසිදු ගැටලුවක් ඇති නො වේ. සාහිත්‍ය, සෞන්දර්ය, සදාචාරය ඈ බෙහෝ ක්ෂේත්‍රවල එ වැනි භාවිත බහුල ව යෙදේ. භාෂාවේ මෙම විවිධ භාවිත මනාව අධ්‍යයනය නො කිරීම නිසා ය. දාර්ශනිකයා බොහෝ දාර්ශනික ගැටලු මතු කරගෙන තිබෙන්නේ. විට්ගන්ස්ටයින් විසින් දාර්ශනික ගැටලුවලට මූලය භාෂා සන්දර්භ

පටලවා ගැනීම බව වරක් සඳහන් කර සිටියේ මේ නිසා ය. කෙසේ නමුත් මෙම කෙටි පැහැදිලි කිරීමෙන් පෙනී යන වැදගත් කරුණක් වන්නේ භාෂා දාර්ශනිකයාගේ කාර්ය සහ වාග් විද්‍යාඥයාගේ කාර්ය ඍජු ලෙස ම දෙ අංශයක ගමන් ගන්නා බව යි.

භාෂා දාර්ශනිකයා විසින් ඉහත කරුණු පදනම් කරගෙන දාර්ශනිකයාගේ කාර්ය භාෂා විශ්ලේෂණ ක්‍රියාවලියකට සීමා කර ගැනීම සඳහා තුඩු දුන් ඓතිහාසික පසුබිම කුමක් ද? යන බව මීළගට සලකා බලමු. මෙවන් විමසීමක් කළ යුතු වන්නේ, අප ඉහත ද සාකච්ඡා කළ පරිදි භාෂා දර්ශනය ඉබේ පහළ වුවක් නො වන නිසා ය. අනෙක් අතට භාෂා දර්ශනයේ උදාව සුදුසු ම අවස්ථාවක සිදු වූ බව ද එ මගින් පෙනී යයි.

සමකාලීන බටහිර දර්ශනය අසවල් වර්ෂයෙන් ඇරඹීයේ යැයි නිශ්චිත කාල වකවානුවක් දැක්වීම ඉතා දුෂ්කර කාර්යකි. එසේ වුවත් දහනව වන සියවසේ අග භාගයේ සහ විසිවන සියවසේ ආරම්භය සමකාලීන දාර්ශනික චින්තන ධාරාවක් විකසිත කිරීම කෙරෙහි බලපෑ ඓතිහාසික කාල වකවානුව ලෙස සටහන් කිරීම සඳහා අවශ්‍ය සාධක සොයා ගැනීම අපහසු නො වේ. සමකාලීන දාර්ශනික චින්තන අතර,

1. රසලියානු තර්කානුසාරී අනුවාදය
2. ඈත විට්ගන්ස්ටෛනියානු චිත්‍රවාදය
3. තර්කානුසාරී යථානුභූතවාදය
4. මෑත විට්ගන්ස්ටෛනියානු දර්ශනය
5. ප්‍රත්‍යක්ෂමය දර්ශනය
6. සන්දෘෂ්ටිකවාදී දර්ශනය
7. මාක්ස්වාදී දර්ශනය

යන සම්ප්‍රදාය විශේෂතාවක් ගෙන තිබේ. සමකාලීන දාර්ශනික දෘෂ්ටිකෝණය අනුව සමකාලීනය තෙක් දාර්ශනික ලෝකයේ මූලික වශයෙන් සිදුවී ඇත්තේ දාර්ශනික පද්ධති ගොඩනැඟීමකි. විඥ්ඥාණවාදී සහ භෞතිකවාදී වශයෙන් හෝ බුද්ධිවාදී සහ අනුභූතීවාදී වශයෙන අපට විද්‍යමාන වන්නේ එම පද්ධතිකරණය යි. දාර්ශනිකයාගේ නිරන්තර සාකච්ඡාවලට භාජනය වූ බොහෝ ගැටලු උත්පාදනය කරනු ලැබුවේත් ඒවා විසඳීමට විවිධ උත්සාහයන් දරා ඇත්තේත් මෙම පද්ධතිකරණය විසින් ම ය. එහෙත් විසඳූ ගැටලුවක් නැත. යල්පැන ගිය මෙම සම්ප්‍රදායික පද්ධතිකරණයෙන් දාර්ශනික ගැටලුවලට සාර්වභෞමික වූ විසඳුමක් කරා එළඹිය නො හැකි බව පිළිගත් සහ ප්‍රත්‍යක්ෂ කළ බට්‍රම් රසල් නවතම විශ්ලේෂණයක් ඔස්සේ සමකාලීන දර්ශනට මංපෙත් හෙළි කළේ ය.

සමකාලීන බටහිර දර්ශනය කුමන වර්ෂයක ඇරඹියේ ද යන්න පිළිබඳ පැහැදිලි පිළිගැනීමක් නොමැත. 19 වන ශතවර්ෂයේ අග භාගයේ සහ 20 වන ශතවර්ෂයේ මුල් භාගයේ දී දර්ශන ක්ෂේත්‍රය අභිභවනය කරමින් පැවතියේ ජර්මන් දාර්ශනික හේගල් ගේ (ක්‍රි.ව. 1770 - 1831) පරමවිඥානවාදී දර්ශනය වේ. නමුත් 20 වන ශතවර්ෂයේ මුල් භාගය මීට වඩා වෙනස් ස්වරූපයක් ගැනීමට පටන් ගත් බව පෙනේ. එයට හේතුව බට්‍රම් රසල්ගේ විප්ලවකාරී කෘති හා පර්යේෂණාකත්මක ලිපි පළ වීම යි.[6]

සමකාලීන දර්ශනයට අත්තිවාරම් දමූ රසල් විසින් ලියා පළ කරන ලද කෘති සංඛ්‍යාව 60කට අධික ය. ඒ අතර **The Principals of Methaematica in 1990, Principa Methaematica, three volumes, in 1910, The Problems of philosophy, in 1912, Our Konwledge of the External World, in 1914, The Analysis of Mind, in 1918, The Analysis of Mind, in 1912, An Enquiry in to Meaning and Truth, in 1940, Humen Knowledge - Its Scope and Limits, in 1948, My Philosophical Development, in 1957**[7]

යන කෘති ඉතා වැදගත් වන අතර මෙයින් 1900 දී පළ වූ ලයිබ්නිස්ගේ දර්ශනය (Acritical Exposition of the Philosophy of Liebnez) සහ 1903 දී පළ වූ උසස් ගණිත ධර්මතා (The Principals of Methaematica) යන කෘතීන් සහ 1905 දී එසබා නැමැති සඟරාවේ පළ කරන ලද අර්ථය දැක්වීම On Denoting නැමැති ලිපිය යනාදී පර්යේෂණයන් සමකාලීන දර්ශනය සඳහා පදනම් Foundation සකස් කළ කෘතීහු වෙති.

මෙම රසලියානු විශ්ලේෂණයන් පදනම් කොට ගෙන ගොඩනැගී සමකාලීන දාර්ශනික අවධිය ඔපවත් කළ වියානා කවය (Vienna Circle) හා බැදුණු තාර්කික යථානුභූතවාදී දාර්ශනිකයන් මෙන් ම ඒ.ජේ. එයර්, ජී.ඊ. මුවර්, ගිල්බට් රයිල්, ආර්.එම්. හෙයර් සහ විශේෂයෙන් විට්ගන්ස්ටෛන් ආදි දාර්ශනිකයන්ට මග පෙන්වන ලද්දේ ඉහත දැක්වූ රසලියානු විමර්ශනයන් ය.

රසලියානු දාර්ශනික විමර්ශන සමකාලීන භාෂාමය දර්ශනය ගොඩ නැගීමට තුඩු දුන් ආකාරය විමසීමට පෙර රසල් පසුබිම් කරගත් නව ප්‍රවණතා මොනවා ද යන්න විමසීම මේ හා අදාළ වූවකි. රසල්ට මග පෙන්වන ලද්දේ විශ්ලේෂී විධික්‍රමය (Analytical Mithod) යි. මෙම විශ්ලේෂී විධි ක්‍රමය භාවිතයට රසල් ව යොමු කරන ලද්දේ ඔහුගේ උසස් ගණිතමය දැනුම සහ විද්‍යාත්මක පසුබිම යි. පහත එන උපුටා ගැනීමෙන් මෙය මනාව තහවුරු වේ.

විශ්ලේෂී කාර්යේ අවසානයේ හමුවන කුඩා ම ඒකකය අනුව යන්නෙන් අදහස් කරයි. එහෙත් එය භෞතික වූවක් නො ව තාර්කික ව ගොඩනගන ලද්දකි.

මෙම අණුවාදය ගොඩනැගීම සඳහා ඔහුට ගණිතමය හා විද්‍යාත්මක පසුබිම මහෝපකාරී වී ඇත. ඒ බව මොහුගේ මෙම කියමනෙන් මනාව පෙනී යයි. කිසිවෙකු ගණිතමය තර්ක ශාස්ත්‍රය මනාව නො දන්නේ නම් ආකෘතිය යන්නෙන් අර්ථවත්

වන්නේ කුමක් ද යන්න තේරුම් ගැනීම ඉතා අසීරු වනු ඇත. මේ අසීරුකම නිසා ආනුභාවික ලෝකය තේරුම් ගැනීමට උත්සාහ කිරීමේ දී මුළා වී නොමග යාමට බොහෝවිට පුළුවන.[8]

රසලියානු අණුවාදය (Logical Atomisim) මගින් උත්සාහ ගෙන තිබෙන්නේ ආනුභාවික ඥානය හා සම්බන්ධ විමර්ශනයක යෙදීමට ය. රසල්ට අනුව ඥානයට පදනම සකස් කරන්නේ මූලික ප්‍රස්තුතයන් ය. සංකීර්ණ ප්‍රස්තුත අණුක ප්‍රස්තුත දක්වා විශ්ලේෂණය කරන්නේ එ බැවිනි. මේවා ඉන්ද්‍රීය දත්ත කියමන් හෙවත් ප්‍රස්තුත ලෙස ද හඳුන්වයි. මේ නිසා රසල්ට අනුව දාර්ශනික කාර්ය වන්නේ ප්‍රස්තුත ආකෘති (Forms of propositions) විග්‍රහයකි.

කෙසේ නමුත් රසල්ගේ දාර්ශනික විමර්ශන භාෂාමය දාර්ශනය සඳහා මනා පසුබිමක් සකස් කළා පමණක් නො ව භාෂාමය දර්ශනයේ ක්ෂේත්‍ර දෙකින් (භාෂාමය දර්ශනයේ ප්‍රධාන අවධි දෙකක් තිබේ. එය පසුව විග්‍රහ කරනු ලැබේ.) එකක් නියෝජනය කිරීමට ද සමත් වී ඇත. එ නම් රසල්ගේ විශ්ලේෂී කාර්ය හා සම්බන්ධ වන්නේ, භෞතික වූ එ නම් සංකල්පීය විග්‍රහයකි. එ වැන්නක් අවධාරණය කළ යුත්තේ රසල් විද්‍යාත්මක ලෝකයෙන් අසීමිත ලෙස ආභාසය ලැබූවකු බැවිනි. රසල් කෙරෙහි බලපෑවේ විද්‍යාව පමණක් නො වේ. 19 වන සියවසේ අග භාගය හා 20 වන සියවසේ මුල් භාගයේ යුරෝපීය සමාජයේ සිදු වූ බොහෝ පරිවර්තනයන් ද ඔහු කෙරෙහි බලපා තිබෙන බව සඳහන් කළ යුතු ය. අනෙක් අතට විද්‍යාත්මක යන නාමයෙන් යමක් ඉදිරිපත් කළ ද එයින් එහි වටිනාකම් ලෝකයා ඉදිරියේ කිසියම් අවතක්සේරුවකට භාජන වීම ද නො වැළැක්විය හැකි විය. එම නිසා බොහෝ විෂය ක්ෂේත්‍ර අවංකව ම විද්‍යාවේ ආභාසය ලැබීම අපේක්ෂා කර තිබේ. එයට හේතුව එ මගින් තම වටිනාකම් (Valuve) වඩාත් උසස් මට්ටමකට පත් වේ යන මතය ප්‍රචලිත ව පැවති බැවිනි.

මේ අනුව සාම්ප්‍රදායික ආගමික දර්ශනයට පරස්පර විරෝධය හැටියට ස්වභාවික විද්‍යාව නැඟී සිටියේ සමාජ - ආර්ථික තලයේ බල පැවැත් වූ අවශ්‍යතාවලට අනුකූල ව ය. කෙසේ වෙතත් නව එළඹුම තුළ පැරණි සංධාරයන් (Traditional Content) ඒවායේ විධික්‍රමත් සමඟ විනාශ කිරීමේ ශක්තියක් ඇති බව වඩා විවෘත ව ප්‍රදර්ශනය කළේ, 20 වන ශතවර්ෂයේ ආරම්භයත් සමඟ ම 19 වන ශතවර්ෂයේ අවසාන භාගයේ යුරෝපයෙන් බිහි වූ චාල්ස් ඩාවින්ගේ පරිණාමවාදය, කොම්ටියානු යථානුභූතවාදී සමාජ විද්‍යාව කාල් මාක්ස්ගේ අර්ථික සහ දේශපාලන විද්‍යාව භෞතික සහ රසායන විද්‍යාවේ නව සොයා ගැනීම් සමඟ වර්ධනය වූ විද්‍යාත්මක විධි ක්‍රමය සාම්ප්‍රදායික දර්ශනයේ ගරා වැටීම ඉක්මන් කරන ලදි. 20 වන ශතවර්ෂය වන විට මෙම නව ආකල්පයන් සියල්ල ම දර්ශනය පිළිබඳ සාම්ප්‍රදායික නිර්වචනය වෙනස් කිරීම සඳහා ඒක රාශි වූයේ විද්‍යාවේ සහ විධි ක්‍රමයේ අනුග්‍රහය සහ ආධිපත්‍යය යටතේ ය.

තාර්කික අණුවාදය ඉදිරිපත් කිරීමෙන් රසල් අපේක්ෂා කළේ, විද්‍යාත්මක විධි ක්‍රමය භාවිත කොට දර්ශන ක්ෂේත්‍රයට නව ජීවයක් ගබා දීමට ය. එය සඵල වී ද යන්න අපගේ විශේෂ අවධානයට ලක් විය යුතු කරුණකි. ඈත ග්‍රීක අවධියේ සිට

මැත සමකාලීනය දක්වා දාර්ශනිකයාට තම සංකල්පීය විමර්ශනයන් මෙහෙයවීම සඳහා උපකාරී වූයේ, ව්‍යවහාරික හෙවත් ස්වභාවික (Natural) භාෂාව යි. එනම් දාර්ශනිකයාගේ චින්තන ක්‍රියාවලියේ දී උපකරණය වූයේ ව්‍යවහාරික භාෂාව යි. කිසියම් දෙන ලද කාර්යක් සාර්ථක ව නිම කිරීම සඳහා යොදාගත් උපකරණය නුසුදුසු නම් එහි අඩුපාඩුකම් අභව්‍ය නො වේ. භාෂා දර්ශනිකයා භාෂාව දකින්නේ ද එ වැනි ම වූ ආකාරයකට ය. එම නිසා පළමු ව උපකරණය එනම් භාෂාව නිවැරදි කළ යුතු ය. ඒ සඳහා භාෂාමය ප්‍රකාශන ප්‍රස්තුත (Propsition) විශ්ලේෂණය කොට ඒවායෙහි ආනුභාවික පදනම් මොනවා ද යන්න විමසා බැලීම කළ යුතු ය. එ මගින් භාෂාවේ සංදිග්ධතා හඳුනාගෙන දාර්ශනික කාර්ය සඳහා එය භාවිත කිරීමෙන් භාෂාව නිසා හට ගෙන තිබෙන දාර්ශනික ගැටලු දියකර හැරිය හැකි වනු ඇත. රසලියානු අණුවාදයේ අපේක්ෂාව ද මෙවැන්නක් කිරීම යි. එම නිසා ය, රසල් දර්ශනය පිළිබඳ මෙ වැනි නිගමනයකට බැස තිබෙන්නේ. එනම් - දර්ශනය වනාහි ප්‍රස්තුත ආකෘති විභජනයකි. මෙහි කේන්ද්‍රීය අපේක්ෂාව ඥානයෙහි ආනුභාවික ස්වරූපය තහවුරු කිරීම යි.

The proper method of philosophy is analysis of the forms of proposition looking for the true understanding form, and synatax of valid knowledge claims the synatax which will lay bare the logical connection between different types of empirical knowledge.[10]

භාෂා දර්ශනයෙහි තවත් පාර්ශ්වයක් ලෙස තාර්කික යථානුභූතවාදය හඳුන්වා දිය හැකි ය. (Logical Positivism) ඔවුහු එක් පැත්තකින් රසලියානු මතය අනුමත කරන අතර අනෙක් පැත්තෙන් සත්‍යාපන මූලධර්මය වඩා අවධාරණයෙන් ඉදිරිපත් කරති. පාවිච්චි වන ඕනෑම ප්‍රකාශනයක් බාහිර කරුණු හා සම්බන්ධ විය යුතු ය. කරුණු සම්බන්ධ නො වන දේ අර්ථශූන්‍ය බව ම ජනිත කරන බැවින් පුද්ගල ඥානයට එහි කිසිදු ඉඩක් නැත. සදාචාරය හා ඍජු ව ම සම්බන්ධ වන ඇගයුම්ශීලී ප්‍රකාශනවලට හෝ සෞන්දර්යාත්මක ප්‍රකාශනවලට මෙම සිද්ධාන්තයේ කිසිඳු ඉඩක් නැත. ඒවා සත්‍යාපන සිද්ධාන්තයෙන් බැහැර දේ ලෙස යි, තාර්කික යථානුභූතවාදීන් සලකන්නේ. ඒ අනුව සංස්ලේශී හෙවත් පශ්චාත් අනුභූත ප්‍රකාශන ඇත්තේ ආනුභාවික විද්‍යා ක්ෂේත්‍රයේ ය. භාෂාමය දාර්ශනිකයා ආදර්ශ කොට ගත යුත්තේ ඒ හා සම්බන්ධ භාෂාමය භාවිතයන් ය. එනම් දාර්ශනිකයා ඉතාමත් සැලකිල්ලෙන් හා පරෙස්සමකින් කිසියම් සීමා සම්මතයක සිට භාෂාව පරිහරණය කළ යුතු බව යි. දාර්ශනික ගැටලු මතු වන්නේ මෙම සීමා සම්මතයෙන් පිටතට ගොස් හෙවත් ඒවා අභිභවනය කොට හිතුමතේ ක්‍රියා කිරීම නිසා ය. මෙම බරපතල ගැටලු සහ වැරදීම් වළකාගනු සඳහා තාර්කික යථානුභූතවාදී දාර්ශනිකයන් යෝජනා දෙකක් ඉදිරිපත් කර ඇත. එනම් සත්‍යාපන සිද්ධාන්තයෙන් ඔබ්බෙහි පවත්නා දේ අර්ථශූන්‍ය ලෙස සලකා බැහැර කරලීම හා විද්‍යාත්මක ක්ෂේත්‍රයේ මෙන් තාර්කික හෙවත් සංකේතාත්මක භාෂාවක් - න ස්වභාවික භාෂාවක් (Non Natural Language) තනා ගැනිම ය.

මෙම නව සම්ප්‍රදාය එනම් තාර්කික යථානුභූතවාදය අවධාරණය කරන ලද කරුණු අතර ප්‍රධාන වූයේ (a) අනුභූතියෙන් සත්‍ය අසත්‍ය සෙවිය නො හැකි ය. ඕනෑම වාක්‍යයක් හෝ ප්‍රස්තුතයක් වේ නම් එය අර්ථශූන්‍ය ලෙස සලකා බැහැර කළ යුතු බව යි. (b) විද්‍යාවේ එන භාෂාවට සමාන භාෂාවක් දර්ශනය සඳහා ද නිර්මාණය කළ යුතු බව යි.[11]

මෙහි එන පළමු කියමන තව දුරටත් අර්ථකථනය කර ගැනීම අවශ්‍ය වේ. එයට හේතුව සමකාලීන දාර්ශනිකයා දර්ශනය හා බැඳී පැවති බොහෝ ක්ෂේත්‍ර එනම් සදාචාර දර්ශනය (Moral Philosophy) සෞන්දර්ය විද්‍යාව (Aesthestic) අධිභෞතිකවාදය (Mitaphysics) සහ ආගමික ක්ෂේත්‍රය (Religion) මුලුමනින් ම බැහැර කරලීම සඳහා කේන්ද්‍රීය මිනුම් දණ්ඩ ලෙස යොදා ගත්තේ මෙම ප්‍රකාශනය වන බැවිනි. මෙම මිණුම් දණ්ඩට (Criteria) අනුව ප්‍රකාශනයක තිබිය යුතු මූලික ම ලක්ෂණය විය යුත්තේ අර්ථවත් භාවය යි. ප්‍රකාශනයක් හා සම්බන්ධ ව අර්ථවත් භාවය රඳා පවතින්නේ බාහිර කරුණු හා සම්බන්ධ වීම මත හෙවත් විස්තරාත්මක කියමනක් වීම මත ය. එ නම් යමක් විස්තර කරන ප්‍රකාශනයකි. ශ්‍රී ලංකාව ඉන්දීය සාගරයේ පිහිටා ඇත. යනු එ වැනි කියමනකි. මෙහි වාච්‍ය වාචක මගින් කිසියම් දෙයක් විස්තර කරනු ලබයි. ප්‍රකාශනය අර්ථවත් නම් ඉන්පසු එය දෙවැනි පියවර වශයෙන් සත්‍ය ද අසත්‍ය ද කියා බැලිය යුතු යි. එ නම් ප්‍රකාශනයෙන් පිටත බාහිර ලෝකයේ කරුණු සමඟ සසඳා බලා ප්‍රකාශනයේ සත්‍ය අසත්‍යතාව විනිශ්චය කළ යුතුය. ප්‍රකාශනය සත්‍ය වුවත් අසත්‍ය වුවත් ගැටලුවක් නො වේ. අවශ්‍ය වන්නේ සත්‍ය අසත්‍යතාව තීරණය කිරීම යි. සත්‍ය නම් ප්‍රකාශනය පිළිගන්නා අතර අසත්‍ය නම් ප්‍රතික්ෂේප කෙරේ. මෙසේ සත්‍ය අසත්‍යතාව පිළිබඳ නිගමනයකට ඒම මගිනුයි ඥානය හා සම්බන්ධ ක්‍රියාවලියක් බවට එය පත් වන්නේ, සත්‍යෝක්ෂණීයතාව ලෙස පිළිගැනෙන්නේ ද මෙම මූල ධර්මය යි.

මෙම කරුණු සියල්ල සම්පිණ්ඩනය කිරීමක් ලෙස අපි පහත සඳහන් ප්‍රකාශන ඉදිරිපත් කරමු.

1. භාෂා දර්ශනය සාම්ප්‍රදායික දර්ශනය මුලුමනින් බැහැර කර භාෂා විශ්ලේෂණ කාර්ය සඳහා සීමා කිරීම.

2. විද්‍යාත්මක සහ ගණිතමය රීති මත ගොඩ නැගුණු විශ්ලේෂී විධික්‍රමය ඍජු ලෙස ම භාෂාමය දර්ශනය ගොඩනැඟීමට ඉවහල් වී තිබීම.

3. භාෂාමය දර්ශනය හදිසියේ පහළ වූවක් නො ව ක්ෂේත්‍රයන්ගේ සහ දාර්ශනිකයන්ගේ ඍජු සහ වක්‍ර දායකත්වය මත හැදී වැඩී පෝෂණය වූවක් බව.

4. භාෂා විශ්ලේෂණ කාර්ය භාෂා විශ්ලේෂණවාදී දාර්ශනිකයා සිතූ පරිදි ඉටු වූයේ නම් තව දුරටත් දාර්ශනික ගැටලු යැයි යමක් ඉතිරි නො වන බව හෙවත් භාෂා දර්ශනයෙන් ප්‍රශ්න සියල්ල විසඳා හමාර කරන බව

භාෂා විශ්ලේෂණ කාර්ය භාෂා විශ්ලේෂණවාදී දාර්ශනිකයා සිතූ පරිදි ඉටු වූයේ නම් තව දුරටත් දාර්ශනික ගැටලු යැයි යමක් ඉතිරි නො වන බව හෙවත් භාෂා දර්ශනයෙන් ප්‍රශ්න සියල්ල විසඳා හමාර කරන බව

මෙම කරුණු අතුරින් සිව්වෙනි කරුණ සම්බන්ධයෙන් එ නම් භාෂා විශ්ලේෂී කාර්ය සඳහා දාර්ශනිකයන් ප්‍රධාන ගුරුකුල දෙකක් යටතේ පිවිස ඇත. වෙනත් ආකාරයකට සඳහන් කරන්නේ නම් භාෂා විශ්ලේෂණවාදී දාර්ශනිකයන් ප්‍රධාන ගුරුකුල දෙකකට බෙදේ. එ නම්,

1. විද්‍යාත්මක ක්ෂේත්‍රයේ මෙන් කෘතිම භාෂාවක් ගොඩනඟා එය උපයෝගී කොට ගෙන දාර්ශනික විමර්ශන දියත් කිරීමට පුරෝගාමී ව ක්‍රියා කළ දාර්ශනිකයන්.

2. කෘත්‍රිම හෙවත් න-ස්වභාවික භාෂාවක් ගොඩනැඟීම වෙනුවට පවත්නා භාෂාවේ විවිධ භාවිත හඳුනාගෙන ඒවායේ අර්ථ විශ්ලේෂණ පැහැදිලි කර දාර්ශනික කාර්ය කළ යුතු බව අවධාරණය කළ දාර්ශනිකයන්.

භාෂාව විශ්ලේෂණය භාෂාමය දාර්ශනිකයන්ගේ ප්‍රධාන අරමුණ ලෙස සැලකිය හැකි වුව ද එය සිදු කළ ආකාරය මත ඔවුන් ප්‍රධාන පෙරමුණු දෙකක් වශයෙන් බෙදා දැක්වීමට පුළුවන. මෙයින් එක් පෙරමුණක් විශ්ලේෂණය ඇසුරෙන් තාර්කික භාෂාවක් ගොඩනැඟීම සම්බන්ධ ප්‍රයත්නයක නිරත වූහ. විශේෂයෙන් රසල්, මුල් විට්ගන්ස්ටෛන්, ඒ.ජේ. එයර් සහ යථානුභූතිවාදී සම්ප්‍රදායට අයත් චින්තකයෝ මෙබඳු උත්සාහයක නිරත ව සිටියහ. එහෙත් මේ ආකල්පය නො පිළිගත් භාෂාමය දාර්ශනිකයන්ගේ අදහස වූයේ, තාර්කික භාෂාවක් ගොඩනඟනු වෙනුවට පවතින භාෂා ව්‍යවහාරය පිළිබඳ විශ්ලේෂණය කිරීමෙන් පමණක් දාර්ශනිකයා නතර විය යුතු බව යි. මෙබඳු ආකල්පයක් මත ක්‍රියා කළ භාෂාමය දාර්ශනිකයන් අතර පසු විට්ගන්ස්ටෛන්, ජී.ඊ. මුවර්, ජේ.එල්. ඔස්ටින්, ගිල්බට් රයිල් වැන්නෝ ප්‍රධාන තැනක් ගනිති.[12]

මීළඟට මෙම භාෂාමය දර්ශනික ගුරුකුල දෙක පිළිබඳ කෙටි විවරණයක යෙදී අපගේ කේන්ද්‍රීය ප්‍රස්තුතය වෙත යොමු විය හැකි ය. එනම් දර්ශනයක් ලෙස භාෂාමය දර්ශනයේ ඇති වැදගත්කම කුමක් ද යන්න තක්සේරු කිරීම යි.

භාෂාමය දර්ශනයේ ප්‍රභවය සහ පසුබිම පිළිබඳ සාකච්ඡා කිරීමේදී බ'ට්‍රඩ් රසල් සහ යථානුභූතවාදී ගුරුකුලය පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් කිරීමට හැකි විය. එම නිසා පළමු දාර්ශනික ගුරුකුලය විද්‍යාත්මක ක්ෂේත්‍රයේ මෙන් තාර්කික භාෂාවක් දර්ශනය සඳහා ද ගොඩනැගිය යුතු යැයි පිළිගත් ගුරුකුලය පිළිබඳ කතා කෙරෙන මෙහි දී එම ගුරුකුලයේ සමස්ත මතය සම්පිණ්ඩණය කර සටහන් කිරීම ප්‍රමාණවත් වේ යැයි හැඟේ. මෙම දාර්ශනික ගුරුකුලයේ ප්‍රධාන සංකල්පය වූයේ විද්‍යාත්මක භාෂාව ආදර්ශයක් ලෙස ගෙන පූර්ණ අනුභූතිවාදී පදනමක් මත තාර්කික භාෂාවක් ගොඩනැගිය යුතු ය යන්න යි. මෙහි දී අපට නැවතත් ස්වාභාවික භාෂාව ඉක්වමා

ගිය පාරිභාෂික අර්ථ (Technical Meaning) සහිත භාෂාවක් ගොඩනැගිය යුත්තේ ඇයි යන ප්‍රශ්නය ඇසීමට සිදු වේ. මෙය පැහැදිලි කර ගැනීමට කරුණු දෙකක් කෙරෙහි අපගේ පූර්ණ අවධානය යොමු කළ යුතු ය. එ නම්,

1. විද්‍යාත්මක හෙවත් තාර්කික (Scientific or Logical) භාෂාවක ස්වරූපය කෙබඳු ද යන බව

2. දාර්ශනික කාර්ය සඳහා ව්‍යවහාරික භාෂාව ප්‍රමාණවත් නො වන්නේ එහි පවත්නා කුමන දුර්වලතා නිසා ද යන බව

විද්‍යාත්මක භාෂාවක මූලික ම ලක්ෂණය වන්නේ එම ක්ෂේත්‍රයට පමණක් ආවේක වූ අර්ථ සහිත වීම යි. එ නම් පාරිභාෂික අර්ථ ගෙන තිබීම යි. කිසියම් විද්‍යාත්මක යෙදුමක් - වචනයක් (Term) සඳහා එකම එක අර්ථයක් පමණක් ඇති බව යි. එම නිසා විද්‍යාත්මක තාර්කික භාෂාව කොතැන කුමන අවස්ථාවක කුමන පුද්ගලයෙකු විසින් භාවිත කරනු ලැබුව ද එම භාෂාවේ අර්ථ විපරීත භාවයක් ජනිත නො වේ. පාරිභාෂික අර්ථ සහිත ව ම යි එම භාෂාව ගොඩනගා තිබෙන්නේ එම නිසා ප්‍රකාශ කරන දෙය ඉතා පැහැදිලි ය. නිරවුල් ය. එසේ ම සීමිත ය. ගැටලු ඇති වීමට ඇති ඉඩකඩ සපුරා ඇහිරී ඇත. ගම්‍යාර්ථ කිසිවක් එහි නැත. මේ ආදි වූ ලක්ෂණයන්ගෙන් යුත් විද්‍යාත්මක භාෂාව තේරුම් ගැනීම ද හැමදෙනාට ම කළ නො හැකි ය. එය වැටහෙන්නේ එම ක්ෂේත්‍රයේ නියුතු වූවන්ට පමණි. එහෙත් ඕනෑම ව්‍යවහාරික භාෂාවකට මෙම විද්‍යාත්මක භාෂාව පරිවර්තනය කර ගැනීමේ අපහසුවක් නැත. එහෙත් එය ඉතාම පරිස්සමින් කළ යුතු කාර්යක් වේ. එ නම් විද්‍යාත්මක පාරිභාෂික අර්ථයන් විපරිත නො වන ආකාරයට එය කිරීම යි.

මෙම විද්‍යාත්මක භාෂාවේ ලක්ෂණ සහිත ව හෙවත් එය ආදර්ශ කොට ගෙන නවතම භාෂාවක් තැනීම භාෂා දාර්ශනිකයන්ගේ වගකීම බව පළමු දාර්ශනික ගුරුකුලයේ පිළිගැනීම විය. ඉහත අප සඳහන් කළ දෙවැනි කාරණය නම් දාර්ශනික කාර්ය සඳහා ව්‍යවහාරයේ පවත්නා නො හැකියාවන් මොනවා ද යන බව මීළඟට විමසා බලමු.

විද්‍යාත්මක භාෂාවකට වඩා ව්‍යවහාරික භාෂාව ඉතාමත් සංකීර්ණ ස්වභාවයක් ගනී. භාෂාමය දාර්ශනිකයන් පෙන්වා දෙන ආකාරයට එහි පවත්නා බරපතල ම ගැටලුව වන්නේ, බාහිර ලෝකය හා සම්බන්ධ කරුණුමය දේ ප්‍රකාශ කිරීම සඳහා මෙන් ම එසේ නො වන දේ ප්‍රකාශ කිරීම සඳහා ද (සමහර විට කරුණුමය අර්ථ ඇතැයි යන උපකල්පනය පාවිච්චි කිරීම) ව්‍යවහාරික භාෂාව එකම ලෙස යොදා ගැනීම සහ ව්‍යවහාරික භාෂා ප්‍රකාශන තුළ මතුපිට අර්ථයට අමතර ව ගම්‍යාර්ථ ද පැවතීම යි. මෙයින් පළමු කරුණ කෙරෙහි සැලකිලිමත් වුවහොත් ඉතාමත් ම සංකීර්ණ බවක් හට ගන්නා අවස්ථාවක් ලෙස එය සටහන් කළ හැකි ය. පහත කියමන් කෙරෙහි අවධානය යොමු කිරීමෙන් මෙය වඩාත් තහවුරු වේ.

1. මෙම කාමරයේ මිනිසෙකු සිටී.

2. මෙම කාමරයේ මකරෙකු සිටී.

මෙම කියමන් දෙකෙන් පළමුවැන්න බාහිර ලෝකයේ කරුණු සමඟ එකඟ ය. එහෙත් දෙවැන්න පිළිබඳ අපට එවැනි නිගමනයකට පැමිණිය නො හැකි ය. මක් නිසා ද යත් එයින් කියැවෙන මකරෙකු සත්‍යෙක්ෂණ සීමාවෙන් ඔබ්බෙහි පවත්නා මනඃකල්පිත වූවක් බැවිනි. නමුත් භාෂාවේ එසේ යෙදීම කිසිම ගැටලුවක් මතු නො කරයි. ව්‍යාකරණානුකූල ව එම වාක්‍ය භාවිතය නිවැරදි බැවිනි. එ වැනි ප්‍රකාශන සෞන්දර්ය, ආචාරධර්ම, ආගමික, අධිභෞතික ආදි ක්ෂේත්‍රයන්හි සුලභ ව යෙදී ඇත. ගැටලුව මතු වන්නේ, ව්‍යාකරණමය හෝ වාග්විද්‍යාත්මක සීමාවෙන් ඔබ්බට ගොස් ඒ හා සම්බන්ධ සද්භාවමය හෙවත් පැවැත්ම පිළිබඳ කතා කිරීමේ දී ය. දාර්ශනික ගැටලු මතු කරන්නේ මෙ වැනි භාවිත නිසා ය.

According to this view, ordinary language that is, the language in which man conduct their practical affairs is part of life, to which it belongs, and philosophical troubles arise from prevension of it-[13]

අනෙක් අතට භාෂා භාවිත කළ ප්‍රකාශනයේ මතුපිට අර්ථයට අමතර ව ගම්‍යාර්ථ පැවතීම ද චින්තන ක්‍රියාවලියේ දී මහත් ගැටලු සහගත තත්වයක් ඇති කරයි.

1. පාසැල් ළමයි ගඟේ පිහිණුහ.

2. ප්‍රේමවන්තයෝ පෙම් සයුරෙහි ගිලුණහ.

මෙම කියමන් දෙක ගත්විට පළමු කියමන ඍජු ව ම ප්‍රකාශ කරන අර්ථය පැහැදිලි ය. එහෙත් දෙවැන්න එසේ නො වේ. අප එහි මතුපිට අර්ථය සැලකිල්ලට ගතහොත් මහත් මුළාවකට පත් වේ. මක් නිසා ද සද්භාවම ය වශයෙන් පෙම් සයුරක් පිළිබඳ අපට කතා කළ නො හැකි බැවිනි. එම නිසා අපගේ අවධානය යොමු විය යුත්තේ මතුපිට අර්ථයට වඩා ගම්‍යාර්ථය - සැඟවුණු අර්ථය කෙරෙහි ය. එහෙත් ප්‍රකාශන දෙකේ භාවිතය සම්බන්ධයෙන් මතුපිට අර්ථය හා සැඟවුණු අර්ථය පිළිබඳ සැලකිලිමත් වීමට අපට සිදු වේ. මෙය ද දාර්ශනික ක්‍රියාවලියේ දී මහත් ගැටලු මතු කරන්නක් ලෙස යි, දාර්ශනිකයන් පෙන්වා දෙන්නේ.

භාෂා දාර්ශනිකයන් අතර පළමු ගුරුකුලය විද්‍යාත්මක භාෂාවක ස්වරූපය ගත් කෘත්‍රිම භාෂාවක් භාවිත කිරීම අවශ්‍ය යැයි අවධාරණය කර සිටින්නේ, ව්‍යවහාරික භාෂාවේ ඉහත කී බොහොමයක් ගැටලු මගහරවා ගෙන සියුම් වූ දාර්ශනික විශ්ලේෂණයන්හි දාර්ශනිකයාට නිරත විය හැක්කේ එ වැනි විකල්පීය භාෂාවක් මාධ්‍ය කොට ගෙන පමණක් යැයි පිළිගත් නිසා ය. ඇත විට්ගන්ස්ටෛන් විසින් Tractatus Logico Philosophicaus යන කෘතිය ඉදිරිපත් කිරීමෙන් අපේක්ෂා කළේ මෙය යි.

භාෂා දර්ශනයේ මූලික ම පදනම වූ තාර්කික භාෂාවක නිෂ්පත්තිය ප්‍රතික්ෂේප කරමින් භාෂාමය දාර්ශනිකයාගේ කාර්ය හා වගකීම විය යුත්තේ සාමාන්‍ය භාෂාව (Ordinary Language) විශ්ලේෂණය කිරීමෙන් එහි විවිධ අර්ථ තේරුම් ගැනීමට උත්සාහ කිරීම යැයි කී, භාෂා විශ්ලේෂණවාදී දාර්ශනිකයන් නියෝජනය කරන්නේ අප මුල දී සඳහන් කළ දෙවැනි භාෂා දාර්ශනික ගුරුකුලය විසිනි. මෙම ගුරු කුලයේ ද පුරෝගාමියා ලෙස ක්‍රියා කරන්නේ විට්ගන්ස්ටෛන් ය. ඔහු මෙසේ සඳහන් කර සිටී. එනම්, දර්ශනය වනාහි භාෂා භාවිත පිළිබඳ විග්‍රහයකි. යනුවෙනි.

මේ දාර්ශනික ශිල්පීය ක්‍රමවලින් කෙරෙනුයේ ව්‍යවහාර භාෂා අඩුලුහුඩුකම් ඌනතා යනාදිය ගෙනහැර දක්වා ඒ වෙනුවට න-ස්වභාවික (කෘත්‍රිම) භාෂාවක් හඳුන්වා දීම නො ව, ව්‍යවහාර භාෂාවේ සියුම් වෙනස් ස්වභාව පැහැදිලි ව සටහන් කිරීම නම් වේ. දර්ශනය වනුයේ ව්‍යවහාර භාෂාවේ වචන හරඹ (Language Games) එක් අතකින් පැහැදිලි කිරීමකි, අනෙක් අතින් ඒවා සටහන් කිරීමකි. මෑත විට්ගන්ස්ටෛන් විසින් ඉතා ඍජු ලෙස ම ඈත විට්ගන්ස්ටෛනියානු මතය ප්‍රතික්ෂේප කර තිබේ.

The later writtgentien, however, no longer speaks of the language but of different uses of language or language games. Consequently, there is no such thing as the limit of language but only limits of language.[15]

කෘතිම භාෂාවක් නිෂ්පාදනය කිරීමෙන් දාර්ශනික ගැටලු විමසීම හෝ දාර්ශනික කාර්ය නිමාවට පත් කිරීමට හෝ අවම වශයෙන් දර්ශන ක්ෂේත්‍රය සඳහා කිසියම් හෝ ආලෝකයක් ලබා දීමට නො හැකි බව මෑත විට්ගන්ස්ටෛන් අවධාරණය කරයි.

දර්ශනයට ගණිතමය තර්ක ශාස්ත්‍රය හෝ භෞතික විද්‍යාව හෝ ගෙනෙන විද්‍යාත්මක භාෂාවෙන් ගත යුතු ආදර්ශයක් නොමැත. අපගේ භාෂාව ඉතාමත් සංකීර්ණ ය. එහි භාවිත බොහොමයකි. දර්ශනයේ ව්‍යායාමය විය යුත්තේ ආදර්ශ භාෂාවන් තැනීම හෝ භාෂා පිළිබඳ වාදයක් ඇති කිරීම නො ව භාෂාවේ භාවිත පැහැදිලි කිරීම ය. එ නම් භාෂා භාවිත සටහන් කර ගැනීමක් මිස භාෂා භාවිත තැනීම (නිපදවීම) නො වේ.[16]

දාර්ශනික ක්ෂේත්‍රයේ ඍජු ව ම අවධි දෙකක් නියෝජනය කරමින් විශාල පෙරළියක් කිරීමට සමත් වූ විට්ගන්ස්ටෛන් පිළිබඳ ව ඔහුගේ ගුරුවරයෙකු වශයෙන් බ'ට්‍රන්ඩ් රසල් මහත් සේ ආඩම්බර වුව ද මුල් කාලීන සංකල්ප ප්‍රතික්ෂේප කරමින් නවතම අර්ථකථන සහිත ව පශ්චාත්කාලීන ව ඔහු විසින් ඉදිරිපත් කරන ලද දර්ශනය (මෑත විට්ගන්ස්ටෛනියානු දර්ශනය) රසල් විසින් මහත් පිළිකුලකින් ප්‍රතික්ෂේප කර ඇති බව බොහෝ දර්ශන විචාරකයෝ පෙන්වා දුන්හ.

So now we've arrived at something that comes under the umbrella turn of linguistic philosophy - which could described as any philosophy based on the assumtion that the subject - matter or philosophy is linguistic (incidemtlly that

is an assumtion that Russel vigorously rejected that the end oh his life) who were its major practitioners-[17]

විට්ගන්ස්ටෛන් විසින් පශ්චාත්කාලීන ව ඔහුගේ මුල් කාලීන දාර්ශනික සංකල්පනා ප්‍රතික්ෂේප කරන ලද්දේ ප්‍රත්‍යක්ෂමය වශයෙන් ඔහු භාෂා භාවිත පුද්ගලයා විසින් තේරුම් ගන්නා ආකාරය පිළිබඳ ව ලබන ලද අත්දැකීම් නිසා ය. අවුරුදු ගණනාවක් පාසැල් ගුරුවරයෙකු ලෙස සේවය කිරීම නිසා කුඩා ළමුන් භාෂාවේ වචන සහ එහි අර්ථ තේරුම් ගන්නේ විවිධ භාවිතවල සිට බව විට්ගන්ස්ටෛන් අවබෝධ කර ගත්තේ ය. මේ අත්දැකීම මත සිට යි, ඔහු විසින් තීරණය කරනු ලැබුවේ තාර්කික භාෂාවක් ගොඩනැඟීම වෙනුවට භාවිතය විශ්ලේෂණය කිරීම ප්‍රමාණවත් බව.

The years Wittgenstein spent in teaching elementary school children may be cosidered that most decisive facter in the shaping of his later philosophy howelse dose one find out whether a child knows that meaning of a word or not except by observing how the child uses the word? And dosen't the explanation of the meaning of a word to children consist precisely teaching use of the word?[18]

මෙම පශ්චාත්කාලීන විට්ගන්ස්ටෛයානු මතය පිළිගෙන ඒ ඔස්සේ ගමන් ගත් තවත් දාර්ශනිකයෝ කීප දෙනෙක් වූහ. ඒ අතර මුවර්, ඔස්ටින්, රයිල් වැන්නෝ ප්‍රධාන වෙති. මේ අතරිනුත් ගිල්බට් රයිල් විසින් රචිත මනස පිළිබඳ සංකල්පය (The Concept of Mind) යන කෘතිය භාෂා විශ්ලේෂණවාදය පිළිබඳ පැහැදිලි චිත්‍රයක් ඇති කර ගැනීම සඳහා විශාල පිටුවහලක් වේ.[19] පසුකාලීන විට්ගන්ස්ටෛනියානු මතය තව දුරටත් පැහැදිලි කරන්නේ නම් ඔහු භාෂාවේ විවිධ භාවිත පැහැදිලි කිරීම සඳහා ක්‍රම ශිල්ප කිහිපයක් ආදර්ශයෙන් හෙවත් ක්‍රමවේදයන් පාවිච්චි කරමිනුයි, මෙම කාර්යෙහි නිරත වන්නේ. එම ශිල්පීය ක්‍රම නම්,

1. වචන හරඹවල සන්දර්භ තේරුම් ගැනීම, ජීවිත ආකාරයක් තේරුම් ගැනීම
2. මෙවලම් උපමාව (Tool Simble)
3. භාෂාව නිවාඩුවකට හැරීම
4. දාර්ශනික කියමනක් අවබෝධ කර ගැනීමේ ව්‍යායාමය කිසිවිටකත් දුෂ්කර නොවීම
5. ආදර්ශය (Model)[20]

මෙම ශිල්පීය ක්‍රම අතුරින් මෙවලම් උපමාව සහ භාෂාව නිවාඩුවකට හැරීම යන ආදර්ශ දෙක ඇසුරින් විට්ගන්ස්ටෛන් භාෂා විශ්ලේෂී කාර්ය සිදු කළ ආකාරය පිළිබඳ විමසා බලමු.

මෙවලම් උපමාව මගින් පෙන්වා දෙන්නේ කිසියම් වචනයක් ගත් විට එයට භාවිත රැසක් ඇති බව ය. වඩුවකුගේ ආයුධ පෙට්ටියක ඇති කිසියම් උපකරණයක් ගත් විට එයින් කළ හැක්කේ එකම කාර්යක් නො වේ. සමහර ආයුධ මගින් කාර්ය කීපයක් කළ හැකි අතර සමහර ආයුධයන්ගේ එම හැකියාව සීමා වේ. මිටිය නැමැති ආයුධයෙන් කෙරෙන්නේ මූලික වශයෙන් ඇණයක් ගැලවීම හෝ ඇණයක් ගැසීම වැනි සීමිත කාර්යකි. මීට අමතර ව අවශ්‍ය නම් වෙනත් කාර්ය සඳහා ද එය භාවිත කළ හැකි ය. භාෂාවේ ඇති වචනයක ස්වරූපයත් මෙසේ ම ය. භාෂා දාර්ශනිකයාගේ කාර්ය විය යුත්තේ ඒ විවිධ පාවිච්චි පැහැදිලි ව සටහන් කර ගැනීම යි. එක් අර්ථයක් හෝ පාවිච්චියක් නො ගෙන විවිධ වූ පාවිච්චි හා අර්ථ පැහැදිලි කර ගත යුතු ය. එවිට පාවිච්චිය කුමක් වුවත් ඒ දෙස බලා අර්ථය හා භාවිතය තේරුම් ගත හැකි බැවින් ගැටලු හට නො ගනී. මෙහි දී කෙරෙන මූලික ම කරුණ වන්නේ දාර්ශනිකයා වචනයක බෙහෝ පාවිච්චි හෙවත් භාවිත ඇති බව වටහා ගැනීම යි. එවිට දාර්ශනිකයාට වැරදී යන්නේ නැත.

භාෂා විශ්ලේෂණයේ අනෙක් ශිල්පීය ක්‍රමය ලෙස ඉහත සටහන් කරන ලද්දේ, භාෂාව නිවාඩුවකට හැරීම යන්න යි. මෙයින් අදහස් කර තිබෙන්නේ ඉහත දැක් වූ පරිදි කිසියම් වචනයක් ගත් විට එයට විවිධ අර්ථ සහ භාවිත ඇති බව යි. එම භාවිත සහ අර්ථ උල්ලංඝනය නො කොට පාවිච්චි කළ යුතු ය යන්න යි මෙයින් අදහස් වනනේ. සීමාවන් ඉක්මවා නො ගොස් වචන භාවිත කළ යුතු ය. කිසියම් සීමාවක හෙවත් සන්දර්භයක පාවිච්චි වන වචනයක් වෙනත් සන්දර්භයක ඒ අර්ථයෙන් ම පාවිච්චි කිරීම දෝෂ සහිත බව හෙවත් ගැටලු මතු කරන බව මෙයින් පෙන්වා දෙයි. මෙම සංක්ෂිප්ත විවරණය මගින් භාෂා දාර්ශනිකයාගේ අරමුණ කුමක් ද යන බව අපට පැහැදිලි වේ. මීළඟට ප්‍රස්තුත මාතෘකාව හා සම්බන්ධ අවසාන කරුණ කෙරෙහි අවධානය යොමු කරමු. එ නම් භාෂා දර්ශනයෙහි වැදගත්කම කුමක් ද යන්න තක්සේරු කිරීම යි.

භාෂා දර්ශනය දාර්ශනික විධික්‍රමයක් වශයෙන් අපගේ නොමද පැසසුමට සහ ඇගයීමට භාජනය විය යුතු බවට කිසිදු විවාදයක් නැත. එ මගින් සමකාලීන දර්ශනයට කිසියම් නව ජීවයක් දීමට ගෙන තිබෙන උත්සාහය ද පැසසුමට ලක් විය යුතු ය. එහෙත් එයින් අපේක්ෂිත කාර්ය ඉටු වී ද යන්න ගැටලු සහගත ය. භාෂා දාර්ශනිකයා (ඉහත අප සඳහන් කළ ගුරු කුල දෙකට ම අයත් දාර්ශනිකයන්) අපේක්ෂා කරන ලද්දේ භාෂාමය දර්ශනයෙන් දාර්ශනික ගැටලු සියල්ල විසඳා හමාර කළ හැකි බව යි. එයට හේතුව දාර්ශනික ගැටලු යැයි අප හඳුනා ගන්නා බොහෝ ගැටලු භාෂාව වැරදි ලෙස පාවිච්චි කිරීම නිසා හටගත් ඒවා වන බැවිනි. මෙයට විසඳුම් සෙවීම සඳහා සියලු ම භාෂාමය දාර්ශනිකයන් උත්සාහ ගෙන තිබේ.

මෙයින් පළමු ගුරුකුලයේ ප්‍රයත්නය ලත් තැන ම ලොප් වී ඇති බව ඉතා පැහැදිලි ය. එනම් නවතම තාර්කික භාෂාවක් ගොඩනැගීමේ ක්‍රියාවලිය යි. දාර්ශනික ගැටලු විසඳනවා තබා අවම වශයෙන් වාස්තවික වූ තාර්කික භාෂාවක් වත් ගොඩ

නගා ගැනීමට ඔවුන්ට නො හැකි වී ඇත. අනෙක් අතට එ වැන්නක් මගින් දාර්ශනික ක්ෂේත්‍රය සහ දාර්ශනිකයාගේ කාර්යභාරය අතිශයෙන් ම පටු සීමාවකට යට වෙන බව ද අපට පෙනී යයි. විශේෂයෙන් මෑත විට්ගන්ස්ටෛන් විසින් ම තම පූර්ව ක්‍රියාවලිය නිෂේධනය කර තිබීමෙන් ම මෙය තහවුරු වේ.

එහෙත් දෙවැනි ගුරුකුලයේ උත්සාහය කිසියම් මල්ඵල ගැන්වීමක් සිදු වූ බව අප පිළිගත යුතු ය. ගිල්බට් රයිල් විසින් හඳුන්වා දෙන ලද (The Concept of Mind) කෘතියෙන් ම එය පැහැදිලි වේ. එසේ වුවත් මෙම ගුරුකුලයට මුහුණ දීමට සිදු වූ බරපතලම ගැටලුව වන්නේ, භාෂාවේ පවත්නා සහස්‍රසංඛ්‍යාත භාවිත සොයා ඒවා සටහන් කර ගැනීම කෙසේ නම් කළ හැකි ද යන්න යි. මේ නිසා භාෂාමය දාර්ශනික සම්ප්‍රදාය දර්ශන ඉතිහාසයට එක්වුණු තවත් දාර්ශනික විධික්‍රමයක් පමණක් වී ඇති බව අපට පෙන්වා දිය හැකි ය.

සමකාලීන දාර්ශනිකයා සාම්ප්‍රදායික දාර්ශනිකයාගෙන් බෙහෙවින් දුරස් වී දර්ශනය සහ දාර්ශනික කාර්ය නවතම මුහුණුවරක් ගන්වන්නට උත්සාහ ගත්තේ ය. එ නම් භාෂාමය කාර්යකට දර්ශනය සීමා කිරීම යි. ඒ සඳහා විද්‍යාත්මක විශ්ලේෂණවාදය මහත් පිටිවහලක් කරගෙන තිබේ. භාෂාව විශ්ලේෂණය කිරීම මගින් දාර්ශනිකයා නතර විය යුතු යැයි භාෂා දාර්ශනිකයන් කල්පනා කරන ලද්දේ, එ මගින් දාර්ශනික ගැටලු විසඳීමට හැකි යැයි කල්පනා කළ නිසා ය. කෙනෙක් මේ සඳහා කෘතිම භාෂාවක් හෙවත් විද්‍යාත්මක ක්ෂේත්‍රයේ දී මෙන් තාර්කික භාෂාවක් තනා ගැනීමේ අවශ්‍යතාව පැහැදිලි කළ අතර කෙනෙක් පවත්නා භාෂාව ම ඒ ඒ සන්දර්භයේ අර්ථ කථනය කර සටහන් කිරීම ප්‍රාමාණිකත්වයෙන් සැලකී ය. කෙසේ නමුත් භාෂා දර්ශනය නිසා දාර්ශනික ක්ෂේත්‍රයේ තුළ කිසියම් නවතාවක් ඇති වූ බව සඳහන් කළ හැකි නමුත් භාෂා දර්ශනය විධි ක්‍රමයක් ලෙස පාවිච්චි කිරීමෙන් අපේක්ෂිත කාර්ය සඵල වූයේ ද යන්න ගැටලු සහිත ය.

## ආන්තික සටහන්


1. **කාන්ටියානු දර්ශනය පිළිබඳ විචාර පූර්වක අධ්‍යයනයක්**, එස්.ජී.එම්. වීරසිංහ, විද්‍යාලංකාර මුද්‍රණය, කැලණිය, 1988, 5 පිට./ **නූතන බටහිර දර්ශනය**, ඒ.ඩී.පී. කලංසූරිය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ: 1973, 261 පිට.
2. **The Encvclopedia of Baitanica**, vol 2, p 799.
3. **සමකාලීන භාෂාමය දර්ශනය**, ලුඩ්විග් විට්ගන්ස්ටෛන්, කුලසේන විදානගමගේ, අභය මුද්‍රණ ශිල්පියෝ, 1993, 1 පිට.
4. **'අනුභූති' පර්යේෂණාත්මක ලේඛණ සංග්‍රහය**, පළමු වෙළුම, දෙවන සගරාව, භාෂාමය දර්ශනයේ සත්‍ය කාර්ය භාරය සහ මාක්ස්වාදී දර්ශනයේ විද්‍යාත්මක පදනම, ඩෙස්මන් මල්ලිකාරච්චි, සංස් පොල්ලමුරේ සෝරත හිමි, අභය මුද්‍රණ ශිල්පියෝ, 1988, 235 පිට.
5. **බට්‍රන්ඩ් රසල් සහ සමකාලීන දර්ශනය**, ඒ.ඩී.පී. කලංසූරිය, ආරිය ප්‍රකාශකයෝ, 1987, 175 පිට.
6. එම 1 පිට.
7. **Modern British Philosophy**, Bryan Magee, Secner and Warbury, London, 1971, p 17-18.

8. **බට්‍රන්ඩ් රසල් සහ සමකාලීන දර්ශනය** එම 18 පිට.

9. **අනුභූති**, එම 230 පිට.

10. **Modern British Philosophy**, do, p 26.

11. **අනුභූති**, එම 230 පිට.

12. **සමකාලීන භාෂාමය දර්ශනය**, එම පිට.

13. **The Encvclopedia of Baitanica**, do, vol, 14, p 759.

14. **විට්ගන්ස්ටෙන් සහ දාර්ශනික ගැටලු**, ඒ.ඩී.පී. කලංසූරිය, සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්මන්ට් සමාගම, කොළඹ: 1986, 74 පිට.

15. **Wittgensteins Conception of Philosophy**, K.T.F. Fann.Basil Blackwell, Oxford,1969, p 83.

16. **බට්‍රන්ඩ් රසල් සහ සමකාලීන දර්ශනය** එම, 7 පිට.

17. **Modern British Philosophy**, do, p 10.

18. **Wittgensteins Conception of Philosophy,** do, p 43.

19. **Modern British Philosophy**, do, p 10.

20. **විට්ගන්ස්ටෙන් සහ දාර්ශනික ගැටලු**, එම, 74 පිට.